4271

(14)

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2014
Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade 09 | විෂයය / பாடம் / Subject ඉතිහාසය | පත්‍රය / வினாத்தாள் / Paper I,II | කාලය / காலம் / Time පැය 02 |

නම :- ........................................ විභාග අංකය :- ....................

සැලකිය යුතුයි:

## I - කොටස

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
- ප්‍රශ්න අංක 01 සිට 20 දක්වා ප්‍රශ්නවලට දී ඇති පිළිතුරු අතරින් ඉතාම නිවැරදි පිළිතුර තෝරා ඊට යටින් ඉරක් අඳින්න.

---

(01) ශ්‍රී ලංකාවට පැමිණි බටහිර ජාතීන් අතර බ්‍රිතාන්‍යයන්ට විශේෂ තැනක් හිමි විය. එයට බලපාන ලද හේතුව කුමක් ද?
(1) ශ්‍රී ලංකාවේ මුහුදුබඩ පළාත් වෙළෙඳ සමාගම යටතේ පාලනය කිරීමයි.
(2) මුහුදු බඩ ප්‍රදේශවල කරන ලද වෙළෙඳාමෙන් අධික ලාභ ලැබීමයි.
(3) උඩරට රාජධානියද යටත් කරගෙන තම බලය මුළු ශ්‍රී ලංකාවේම පැතිර වීමයි.
(4) ඉතා පහසුවෙන් ලංකාවේ බලය තහවුරු කර ගැනීමයි.

(02) පෙරදිග වෙළෙඳ ආධිපත්‍යය ලබාගැනීම සඳහා ඉංග්‍රීසින් සමග තරගයක නිරත වී ත්‍රිකුණාමල වරායට අවධානය යොමුකළ යුරෝපා ජාතිය වූයේ.
(1) ස්පාඤ්ඤ ජාතිකයින් ය. (2) ප්‍රංශ ජාතිකයින් ය.
(3) පෘතුගීසි ජාතිකයින් ය. (4) ලන්දේසි ජාතිකයින් ය.

(03) උඩරට රදළ ප්‍රධානීන් හා ඉංග්‍රීසීන් අතර අත්සන් තැබූ වගන්ති දොළහකින් යුතු උඩරට ගිවිසුමේ පස්වන වගන්තිය ඉතා වැදගත් වූයේ කුමන හේතුවක් නිසා ද?
(1) නායක්කර් වංශිකයන්ට උඩරට පාලනය මින් පසු අහිමිවන නිසා ය.
(2) දේශීය නිලධාරීන්ගේ බලතල හා වරප්‍රසාද ආරක්ෂා වන නිසා ය.
(3) ආණ්ඩුකාරයාගේ අවසරයකින් තොරව මරණ දඬුවම පැනවීම තහනම් වන නිසා ය.
(4) බුද්ධාගම, දේවාගම, බෞද්ධ භික්ෂූන් වහන්සේලා හා පූජනීය ස්ථාන ආරක්ෂා කරන නිසා ය.

(04) සිංහලේ පළමුවන නිදහස් සටන ලෙස හඳුන්වන වෙල්ලස්ස අරගලයට බලපෑ ආසන්නම හේතුව කුමක් ද?
(1) සිල්වෙස්ටර් විල්සන් ඇතුළු බ්‍රිතාන්‍ය භට පිරිසක් දොරේසාමි අත්අඩංගුවට ගැනීමයි.
(2) රදළ ප්‍රධානීන් වරප්‍රසාද හා ආදායම් මාර්ග අහිමි වීමයි.
(3) මුහන්දිරම් තනතුරක් වූ මඩිගේ ලේකම් වශයෙන් මුස්ලිම්වරයෙකු පත් කිරීමයි.
(4) බ්‍රිතාන්‍ය පාලකයින් උඩරට ගිවිසුමේ කොන්දේසි වලට පටහැනිව කටයුතු කිරීමයි.

175

(05) උඩරට හා පහතරට ඒකාබද්ධ කොට පාලන පහසුව සඳහා ශ්‍රී ලංකාව පළාත් පහකට බෙදනු ලැබුවේ කුමන ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයෙන් ද?

(1) කෝල්බෲක් ප්‍රතිසංස්කරණයෙනි. (2) ඩොනමෝර් ප්‍රතිසංස්කරණයෙනි.
(3) මැනිං ප්‍රතිසංස්කරණයෙනි. (4) සෝල්බරි ප්‍රතිසංස්කරණයෙනි.

(06)
- පළාත්බද ඡන්ද කොට්ඨාස ක්‍රමය හඳුන්වා දීම.
- ප්‍රථමවරට ඡන්දබලය හඳුන්වා දීම.
- විධායක කාරක සභා ක්‍රමය හඳුන්වා දීම.

ඉහත සඳහන් යෝජනා ඉදිරිපත් කළ ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ පිළිවෙළින් දක්වා ඇති පිළිතුර තෝරන්න.

(1) මැනිං, ඩොනමෝර් හා කෝල්බෲක් (2) ඩොනමෝර්, මැනිං, සෝල්බරි
(3) මැනිං, මැකලම්, ඩොනමෝර් (4) කෝල්බෲක්, මැකලම්, ඩොනමෝර්

(07) සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව අග්‍රාමාත්‍යවරයා යටතේ තබාගත යුතු වූ අමාත්‍යාංශ දෙක දක්වෙන පිළිතුර කුමක් ද?

(1) අධිකරණ හා කෘෂිකර්ම (2) ස්වදේශ කටයුතු හා විදේශ කටයුතු
(3) අධ්‍යාපනය හා සෞඛ්‍යය (4) ආරක්ෂක හා විදේශ කටයුතු

(08) ඩොනමෝර් ප්‍රතිසංස්කරණ යටතේ මෙරට ජනතාවට සර්වජන ඡන්ද බලය ලැබිණි. ඒ අනුව ඡන්දය භාවිතා කිරීමේ හැකියාව ලැබුණේ,

(1) අවුරුදු 21ට වැඩි ස්ත්‍රී පුරුෂ සියලු දෙනාටය.
(2) අවුරුදු 18ට වැඩි ස්ත්‍රී පුරුෂ සියලු දෙනාටය.
(3) අවුරුදු 16ට වැඩි ස්ත්‍රී පුරුෂ සියලු දෙනාටය.
(4) අවුරුදු 21ට වැඩි පිරිමින්ට පමණය.

(09) කිතු දහම ව්‍යාප්ත කිරීමේ දී ප්‍රධාන වශයෙන් යාපනය ඇතුළු උතුරු ප්‍රදේශ මූලික කොටගෙන කටයුතු කළේ.

(1) බැප්ටිස් මිෂනාරි සමාගමයි. (2) ඇමරිකානු මිෂනාරි සමාගමයි.
(3) චර්ච් මිෂනාරි සමාගමයි. (4) වෙස්ලියන් මිෂනාරි සමාගමයි.

(10) පොත් පත් සඟරා මගින් බුදුදහම පතුරුවා හැරීමේ පියවරක් වශයෙන් හික්කඩුවේ සුමංගල හිමියන්ගේ මූලිකත්වයෙන් ආරම්භ වූ පුවත්පත කුමක් ද?

(1) මහාබෝධි පුවත්පත (2) ලංකාලෝකය පුවත්පත
(3) සිංහල බෞද්ධයා පුවත්පත (4) ඥාන ප්‍රදීප පුවත්පත

(11) A. ශෛව පරිපාලන සභාව ආරම්භ කිරීම.
B. මද්‍රාසා පාසල් ප්‍රතිසංවිධානය කිරීම.
C. "පාලපාඩම්" ග්‍රන්ථය රචනා කිරීම
D. මරදානේ සහිරා විද්‍යාලය ආරම්භ කිරීම.

ඉහත දක්වා ඇති සිදුවීම් වලින් අරුමුග නාවලර් තුමාට සම්බන්ධ කාර්යයන් වන්නේ,

(1) A හා C ය. (2) B හා C ය. (3) A හා B ය. (4) C හා D ය.

176

(12) ජාතික දේශපාලනය වෙනුවෙන් කටයුතු කළ පුද්ගලයින් 'අ' තීරුවේද ඔවුන් හැඳින්වූ අන්වර්ථ නාම 'ආ' තීරුවේද දක්වේ. එම තීරු දෙක නිවැරදිව ගැලපූ විට ලැබෙන පිළිතුර තෝරන්න.

| අ | | ආ | |
|---|---|---|---|
| 1. | පිලිප් ගුණවර්ධන මහතා | A | ආසියාවේ රිදී සීනුව |
| 2. | ඒ. ඩබ්. පෙරේරා මහතා | B | පරිප්පු මහත්මයා |
| 3. | එස්. ඩබ්. ආර්. ඩී. බණ්ඩාරනායක මහතා | C | බොරැළුගොඩ සිංහයා |
| 4. | එන්.එම්. පෙරේරා මහතා | D | කෝට්ටේ සිංහයා |

(1) CADB (2) CDBA (3) DCAB (4) CDAB

(13) 1919 පිහිටුවා ගනු ලැබූ ලංකා ජාතික සංගමයේ ප්‍රථම සභාපති වරයා වූයේ,
(1) ඩී.එස්.සේනානායක මහතාය. (2) පොන්නම්බලම් රාමනාදන් මහතා
(3) පොන්නම්බලම් අරුණාචලම් මහතාය. (4) ඩී.බී. ජයතිලක මහතාය.

(14) ඩඩ්ලි සේනානායක මහතා 1953 දී අගමැති තනතුරෙන් ඉල්ලා අස්වූයේ කුමන හේතුව නිසාද?
(1) පාර්ලිමේන්තුවේ නිල කාලය අවසන් වීමෙනි.
(2) හර්තාලය නැමති විරෝධතා ව්‍යාපාරය නිසාය.
(3) බුදුදහමට නිසි ගෞරව ලබා නොදීම නිසාය.
(4) වෙනත් පක්ෂයකට සම්බන්ධ වීම සඳහාය.

(15) දේශ ගවේෂණ කටයුතු සඳහා යුරෝපීය ජාතීන් අතර කලාප වෙන් කිරීමේ දී ස්පාඤ්ඤ ජාතිකයන්ට වෙන් වූයේ කුමන කලාපය ද?
(1) පෙරදිග හා ඉන්දියන් සාගර කලාපයයි. (2) උතුරු හා දකුණු අප්‍රිකා කලාපයයි.
(3) උතුරු හා දකුණු ඇමරිකා කලාපයයි. (4) මැදපෙරදිග හා උතුරු අප්‍රිකා කලාපයයි.

(16) යුරෝපා ජාතීන් ගේ යටත් විජිත ඇති කරගැනීමේ අරමුණු විවිධ වූ අතර කාර්මික විප්ලවයෙන් පසු යටත් විජිත බිහි කරගැනීමේ අරමුණක් දක්වෙන පිළිතුර කුමක් ද?
(1) ආගම ප්‍රචාරය කිරීම. (2) වෙළෙඳ කටයුතු වල ආධිපත්‍ය ය ලබා ගැනීම.
(3) ජාත්‍යන්තර කීර්තිය ලබා ගැනීම. (4) යුරෝපියයන්ට රැකියා ලබා දීම.

(17) දෙවන ලෝක යුද්ධයෙන් පසු නිදහස ලබාගත් රටවල් පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.
(1) ඉන්දියාව, පිලිපීනය, ඉන්දුනීසියාව (2) ශ්‍රී ලංකාව, මලයාසියාව, කැනඩාව
(3) ඉන්දියාව, ජර්මනිය, ඉතාලිය (4) ඔස්ට්‍රියාව, සර්බියාව, පිලිපීනය

♦ අංක 18 - 20 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා සිතියම උපයෝගී කර ගන්න.



(18) G අක්ෂරයෙන් පෙන්වා ඇති ගංගාව කුමක් ද?

(1) මහවැලි ගංගාව (2) වලවේ ගංගාව (3) මල්වතු ඔය (4) දැදුරු ඔය

(19) ත්‍රිකුණාමලය දක්වා ඇත්තේ කුමන අක්ෂරයෙන් ද?

(1) B අක්ෂරයෙනි. (2) C අක්ෂරයෙනි (3) D අක්ෂරයෙනි (4) A අක්ෂරයෙනි

(20) E අක්ෂරයෙන් දක්වා ඇති ප්‍රදේශය කුමක් ද?

(1) තුන් කෝරළය (2) සත් කෝරළය (3) සතර කෝරළය (4) නුවර කලාවිය

## II කොටස

- පළමුවන ප්‍රශ්නයට පිළිතුරු සැපයීම අනිවාර්ය වේ.
  - තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.
  - පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව පහකි.

(01) ඉතිහාසය විෂයය සඳහා තුන්වන වාරයේ කරන ලද පාසල් පදනම් කරගත් ඇගයීම් ක්‍රියාකාරකම ඇසුරෙන් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) ඇගයීම සඳහා ඔබ සිදුකළ ක්‍රියාකාරකම කුමක් ද? (ලකුණු 02)

(ii) ක්‍රියාකාරකම සඳහා යොදාගත් පාඩම් ඒකකයේ නම ලියන්න. (ලකුණු 02)

(iii) ක්‍රියාකාරකමට පෙර ඔබට ගුරුවරයාගෙන් ලැබුණු උපදෙස් දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04)

(iv) ඔබ හෝ ඔබේ කණ්ඩායම විසින් ලකුණු කරන ලද රටවල් හතරක් නම් කරන්න. (ලකුණු 04)

(v) මෙවැනි ක්‍රියාකාරකම් වල නිරත වීම තුළින් ඔබට ලැබෙන ප්‍රයෝජන දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04)

(02) (i) පහත සඳහන් වර්ෂවල ඉදිරිපත් වූ ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ හැඳින්වූ නම් සඳහන් කරන්න.

A - 1833 -

B - 1947 - (ලකුණු 02)

(ii) පහත සඳහන් සිද්ධීන් හා සම්බන්ධ පුද්ගලයින්ගේ නම් වරහන් තුළින් තෝරා අනුපිළිවෙළින් දක්වන්න.

C. මැකලම් ප්‍රතිසංස්කරණ යටතේ ව්‍යවස්ථාදායක සභාවට පත් වූ උගත් ලාංකිකයා

D. ඩොනමෝර් ආණ්ඩුක්‍රමය යටතේ ඇතිවූ අධ්‍යාපනය පිළිබඳ විධායක කාරක සභාවේ සභාපති වරයා.

(ආරුමුගම් පිල්ලේ කුමාරස්වාමි, පොන්නම්බලම් රාමනාදන්, පොන්නම්බලම් අරුණාචලම්, A.E. ගුණසිංහ, C.W.W. කන්නන්ගර) (ලකුණු 04)

(iii) ඉස්ලාම් ආගමික පුනර්ජීවනය උදෙසා සිද්දි ලෙබ්බේ තුමා කටයුතු කළ ආකාරය පිළිබඳ කෙටි විස්තරයක් කරන්න. (ලකුණු 05)

178

(03) ශ්‍රී ලංකාවට පැමිණි බටහිර ජාතීන් අතර බ්‍රිතාන්‍යයන්ට හිමිවන්නේ වැදගත් ස්ථානයකි.

(i) බ්‍රිතාන්‍යයන් ශ්‍රී ලංකාවට අවධානය යොමු කිරීමට බලපෑ හේතු දෙකක් ලියා දක්වන්න. (ලකුණු 02)

(ii) 1797 ඇති වූ මුහුදුබඩ කැරැල්ල පිළිබඳ සොයා බැලීමට පත්කළ "මියුරන් කමිටුව" විසින් ගැටලු විසඳීම සඳහා ඉදිරිපත් කරන ලද යෝජනා දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04)

(iii) බ්‍රිතාන්‍යයන්ට උඩරට රාජ්‍යය යටත් කරගැනීමේ අවශ්‍යතාවය ඇතිවීමට බලපෑ හේතු දෙකක් විස්තර කරන්න. (ලකුණු 05)

(04) (i) බ්‍රිතාන්‍ය පාලනයට විරුද්ධව 1848 ආරම්භ වූ දෙවන නිදහස් සටනට නායකත්වය දුන් පුද්ගලයන් දෙදෙනෙක් නම් කරන්න. (ලකුණු 02)

(ii) දෙවන නිදහස් සටන පිළිබඳ පහත සඳහන් තොරතුරු සපයන්න.

A. සටන ආරම්භ වූ ප්‍රදේශය -

B. සටන පැතිරුණු ප්‍රදේශ දෙකක් -

C. මේ කාලයේ සිටි ඉංග්‍රීසි ආණ්ඩුකාරයා - (ලකුණු 04)

(iii) 1848 ඇතිවූ නිදහස් අරගලයට බලපෑ හේතු දෙකක් විස්තර කරන්න. (ලකුණු 05)

(05) (i) පහත සඳහන් තොරතුරුවලට අදාළ පුද්ගලයින් A - B අනුපිළිවෙළින් නම් කරන්න.

A. පරම විඥානාර්ථ බෞද්ධ සමාගම පිහිටුවීම

B. වාදීභසිංහ යන අන්වර්ථ නාමයෙන් පිදුම් ලැබීම. (ලකුණු 02)

(ii) කිතුදහම ප්‍රචාරය කිරීම සඳහා මිෂනාරි ව්‍යාපාර අනුගමනය කළ ක්‍රියාමාර්ග හතරක් සඳහන් කරන්න. (ලකුණු 04)

(iii) බෞද්ධාගමික පුනර්ජීවනය උදෙසා අනගාරික ධර්මපාල තුමා කටයුතු කළ ආකාරය කරුණු දෙකක් ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු 05)

(06) (i) ශ්‍රී ලංකාවට නිදහස ලබා දීමට තීරණය කිරීමෙන් පසුව බ්‍රිතාන්‍යයින් එවකට අගමැතිව සිටි ඩී.එස්. සේනානායක මහතා සමඟ අත්සන් කරන ලද එකඟතා ගිවිසුම් දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

(i) පහත A,B,C,D වශයෙන් දක්වා ඇති පින්තූරවලින් පෙන්වන ගොඩනැගිලි අනුපිළිවෙළින නම් කරන්න.

A



B



C



D



(ලකුණු 04)

(iii) 1978 දෙවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් හඳුන්වාදුන් විධායක ජනාධිපතිවරයා සතු බලතල හා වරප්‍රසාද පිළිබඳ කෙටි විස්තරයක් කරන්න. (ලකුණු 05)

(07) (i) සූවස් ඇළෙන් සම්බන්ධ කෙරෙන මුහුදු දෙක නම් කරන්න. (ලකුණු 02)

(ii) පළමුවන හා දෙවන ලෝක යුද්ධ සම්බන්ධයෙන් A හා B වලින් දක්වා ඇති තොරතුරු සපයන්න.

A. පළමුවන ලෝක යුද්ධයට ඇමරිකාව සම්බන්ධවන අවස්ථාව .

B. දෙවන ලෝක යුද්ධය ආරම්භවන අවස්ථාව. (ලකුණු 04)

(iii) දෙවන ලෝක සංග්‍රාමයේ ප්‍රතිඵල දෙකක් විස්තර කරන්න. (ලකුණු 05)

The National e-learning Portal for The General Education